*සැ. යු.-* 2015.07.24 දින පළවූ අංක 1925 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,926 - 2015 ජූලි මස 30 වැනි බ්‍රහස්පතින්දා - 2015.07.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1084 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1084 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 1085 |


*සැ. යු.-* ත්‍රිකුණාමලය, පන්කුලම, මොරවැව දකුණු සිරිගජබා ගල්ලෙන් රජමහා විහාරස්ථ සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2015 ජුනි මස 12 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 අගෝස්තු මස 21 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 අගෝස්තු මස 07 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1083 - B 80970— 5,352 (2015/07)
F 1 –

# තනතුරු ඇබෑර්තු

## ගාල්ල මහ නගර සභාව

*අයදුම්පත් කැඳවීමේ කාලය සංශෝධනය කිරීම*

2015.06.26 දින පළකර ඇති අංක 1921 දරන *ගැසට් පත්‍රයේ* සඳහන් කර ඇති ගාල්ල මහ නගර සභාවේ පුරප්පාඩු වී ඇති තනතුරු සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අයදුම්පත් කැඳවනු ලබන කාල සීමාව “2015.08.25 දින සිට 2015.09.15 දක්වා” යනුවෙන් මෙයින් සංශෝධනය කරමි.

හදිසි මහ මැතිවරණය ප්‍රකාශයට පත්කිරීම හේතුවෙන් ඉහත සංශෝධනය සිදු කරනු ලබන අතර අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් අනෙකුත් කරුණු නොවෙනස්ව පවතී.

රනිල් වික්‍රමසේකර,
නාගරික කොමසාරිස්,
ගාල්ල මහ නගර සභාව.

07-1407

---

# පළාත් පාලන නිවේදන

## අගලවත්ත ප්‍රාදේශීය සභාව

1975 අංක 4 දරන වීථි නම් කිරීම, ස්මාරක ඉදිකිරීම හා පාලනය කිරීමේ පනත යටතේ ක්‍රීඩාංගනයක් නම් කිරීම

අගලවත්ත ප්‍රාදේශීය සභාවේ සභා සම්මුතියට අනුව ක්‍රීඩාංගන නාමය වෙනස් කිරීම පහත සඳහන් පරිදි තීරණය කරන ලදී. 1975 හි අංක 4 දරන වීථි නම් කිරීම, ස්මාරක ඉදිකිරීම හා පාලනය කිරීමේ පනතේ විධිවිධාන පරිදි බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යතුමා විසින් ලබාදෙන ලද අනුමැතිය ප්‍රකාරව පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇති ක්‍රීඩාංගනය සඳහා ක්‍රීඩාංගන නාමය ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් දන්වමි.

චාමින්ද රණවක,
සභාපති,
අගලවත්ත ප්‍රාදේශීය සභාව.

2015 ජූලි මස 09 වැනි දින,
අගලවත්ත ප්‍රාදේශීය සභාව.

**උපලේඛනය**

| *පැරණි ක්‍රීඩාංගන නාමය* | *භාවිතා කළ යුතු නාමය* | *ක්‍රීඩාංගනය පිහිටීම* |
|---|---|---|
| උඩවෙල ක්‍රීඩාංගනය | චාමින්ද රණවක ක්‍රීඩාංගනය | 828 උඩවෙල ග්‍රාම නිලධාරි වසමේ උඩවෙල හැළඹ මාර්ගය හා උඩවෙල පියරතන විදුහලට යාබදව මෙම ක්‍රීඩාංගනය පිහිටා ඇත. |

07-1282

---

## උඩුබද්දාව ප්‍රාදේශීය සභාව

1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

261 වන අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව උඩුබද්දාව ප්‍රාදේශීය සභාව විසින් 2015.05.14 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ අංක 8.02 යටතේ පහත යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. එම්. රාජ් සිසිර කුමාර,
සභාපති,
උඩුබද්දාව ප්‍රාදේශීය සභාව.

2015 මැයි මස 14 වැනි දින,
උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ දී ය.

**යෝජනාව**

"1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු 261 වන අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වයඹ පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වයඹ පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2011.12.01 දින අංක 1734/18 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(අ) කොටසේ පළ කරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත්කරන ලද්දවූ ද ප්‍රාදේශීය සභාවල ආදහනාගාර විධිමත් කිරීම, පාලනය කිරීම හා ගාස්තු අයකිරීම, අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයන්හි කටයුතු පාලනය කිරීම, විධිමත් කිරීම, අධීක්ෂණය හා ගාස්තු අයකිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට ක්‍රියාත්මක කිරීමට පිළිගැනීමට ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තිය (1) උපවගන්තිය යටතේ උඩුබද්දව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය."

07-1426

---

# විවිධ දැන්වීම්

## කාත්තන්කුඩි නගර සභාව

### බලපත්‍ර ගාස්තු

නගර සභා ආඥාපනතේ 164 වැනි වගන්තිය අනුව කාත්තාන්කුඩි නගර සභා බල ප්‍රදේශය තුළ කිසිදු ස්ථානයක් හෝ මධ්‍යස්ථානයක් කර්මාන්ත හෝ ව්‍යාපාර කටයුතුවලට හෝ භාවිතා කරමින් පවතී නම් ඒ සඳහා බලපත්‍ර හෝ බලපත්‍ර ගාස්තු ගෙවිය යුතුය. එම බලපත්‍ර 1956 වසරේ අංක 6 දරන පළාත් පාලන කාර්යාලය විසින් අනුමත කරන ලද අන්තර් කාල පනත අනුව ඇමතිතුමා විසින් සකස් කරන ලද අංක 10609 දරන 1953 වසරේ නොවැම්බර් මස ගැසට් පත්‍රයේ පලවූ නගර සභා අන්තර්කාල පනත මෙම නගර සභාව විසින් සම්මත කර 2012.01.04 වැනි දින (iv) (ආ) වැනි කොටසේ අංක 11219 දරන *ගැසට් පත්‍රයේ* ප්‍රකාශිත නියෝග අනුව පහත සඳහන් වගුවල සඳහන් කර ඇති කර්මාන්ත, ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහාය. එමෙන්ම තවමත් එවැනි ස්ථානවල හෝටල්, ආපනශාලා ආදියේ 2014 වර්ෂයේ ආදායමෙන් 1% බැගින් බලපත්‍ර ගාස්තුවට ඇතුල්වන අතර අනෙකුත් කර්මාන්ත, ව්‍යාපාර ස්ථානවල වාර්ෂික වටිනාකම අනුව පහත සඳහන් පරිදි ගාස්තු අයකරනු ලැබේ.

ජේ. සර්වේස්වරන්,
ලේකම්,
නගර සභාව, කාත්තන්කුඩි.

2015 ජූලි මස 07 වැනි දින,

| *අංකය* | *වෙළඳ හෝ ව්‍යාපාරයේ ස්වභාවය* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම* | | |
|---|---|---|---|---|
| | | *රු.750 කට වැඩි නොවන විට* | *රු.750ට වැඩි නමුත් 1,500 ට වැඩි නොවන විට* | *රු.1,500ට වැඩිවන විට* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 01. | තේ කඩයක් පවත්වාගෙන යාම | 500 | 750 | 1,000 |
| 02. | කෝපි කඩයක් පවත්වාගෙන යාම | 500 | 750 | 1,000 |
| 03. | භෝජන ශාලාවක් පවත්වාගෙන යාම | 500 | 750 | 1,000 |
| 04. | කෙටි කෑම වර්ග විකුණුම් ස්ථානයක් පවත්වාගෙන යාම | 500 | 750 | 1,000 |
| 05. | පාන් පෝරණුවක් පවත්වාගෙන යාම | 500 | 750 | 1,000 |
| 06. | කිරි විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 | 750 | 1,000 |
| 07. | මස් විකිණීම | 500 | 750 | 1,000 |
| 08. | මාළු විකිණීම | 500 | 750 | 1,000 |
| 09. | උත්සව දිනවල ආහාර සැපයීම (කේටරින් සර්විස්) | 500 | 750 | 1,000 |
| 10. | නවාතැන්පලක් නඩත්තු කරගෙන යාම | 500 | 750 | 1,000 |
| 11. | කේශාලංකාර සේවා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 | 750 | 1,000 |
| 12. | විදුලිබල බේකරියක් | 500 | 750 | 1,000 |
| 13. | විලාසිතා නිරූපනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 | 750 | 1,000 |
| 14. | අයිස් නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 | 750 | 1,000 |
| 15. | ලොන්ඩරියක් | 500 | 750 | 1,000 |
| 16. | ජංගම ව්‍යාපාරිකයන් | 500 | 750 | 1,000 |
| 17. | පරිසර දූෂක කරමාන්ත | 500 | 750 | 1,000 |
| 18. | (යන්ත්‍රානුසාරයෙන්) ඇඳුම් සෝදන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 | 750 | 1,000 |
| 19. | සිසිල් කල ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 | 750 | 1,000 |
| 20. | කිරි පට්ටි | 500 | 750 | 1,000 |

07-1270/1

## කාත්තන්කුඩි නගර සභාව

ව්‍යාපාර බදු පැනවීම

නගර සභා ආඥාපනතේ 165(අ) වැනි වගන්තියෙන් මෙම නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මෙම නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇති පරිදි වෙළඳ ව්‍යාපාරික ස්ථාන සඳහා 2014 වසරේ වාර්ෂික ආදායම් මත පදනම් වූ වාර්ෂික බද්දක් 2015 වර්ෂය සඳහා අය කරනු ලැබේ.

ජේ. සර්වේස්වරන්,
ලේකම්,
කාත්තන්කුඩි නගර සභාව.

2015 ජූලි මස 07 වැනි දින,

| *අනු. අංකය* | *වෙළඳ ව්‍යාපාරයේ ස්වභාවය* |
|---|---|
| 01. | නිමි ඇඳුම් සහිත රෙදිපිළි අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම |
| 02. | නිමි ඇඳුම් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම |
| 03. | ඇඳුම් මැසීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම |
| 04. | ස්වර්ණාභරණ අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම |
| 05. | පිටි හෝ සීනි තොග වශයෙන් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම |
| 06. | මෝටර් වාහන අමතර කොටස් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම |
| 07. | පාපැදි අමතර කොටස් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම |
| 08. | පාපැදි අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම |
| 09. | කුෂන් ගෘහ භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 10. | රූපවාහිනී යන්ත්‍ර අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම |
| 11. | රූපවාහිනී යන්ත්‍ර අමතර කොටස් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම |
| 12. | ඔරලෝසු අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 13. | මැටි භාණ්ඩ අලෙවි කිරීමේ හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 14. | ඡායා පිටපත් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 15. | වී හෝ සහල් ගබඩාකර හෝ විකිණීම |
| 16. | ධීවර ආම්පන්න අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 17. | ඇළුමිනියම් භාණ්ඩ අලෙවි කරන හෝ එකතු කරන ස්ථානයක් පවත්වාගෙන යාම |
| 18. | මළ නොබැඳෙන ලෝහ භාණ්ඩ විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම |
| 19. | ඇස් කණ්නාඩි අලුත්වැඩියා කිරීමේ හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 20. | මේස, පුටු සහ කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 21. | විසිතුරු භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 22. | මහන මැෂින් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 23. | බිත්තර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 24. | ක්‍රීඩා උපකරණ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 25. | බිස්කට් වර්ග ගබඩාකොට විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම |
| 26. | කිරි පිටි පැකැට්ටු අලෙවි කිරීමේ හා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 27. | ත්‍රී රෝද රථ අමතර කොටස් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම |
| 28. | පරණ රන් භාණ්ඩ මිලදී ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 29. | ප්ලාස්ටික් භාණ්ඩ අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම |
| 30. | පරිගණක පුහුණු කිරීමේ ආයතනයක් පැවැත්වීම |
| 31. | පරිගණක අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම |
| 32. | පරිගණක අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 33. | පරිගණක අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 34. | ජංගම දුරකථන අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 35. | ජංගම දුරකථන අලෙවිසැල් හා අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 36. | පිඟන් ගඩොල් භාණ්ඩ අලෙවිය |
| 37. | ෆිල්ම් රෝල් මුද්‍රණය කිරීම සඳහා වූ රසායනාගාරයක් පවත්වාගෙන යාම |
| 38. | අලෙවි නියෝජිත |
| 39. | පැදුරු පෙට්ටි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 40. | ගොඩනැගිලි උපකරණ කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 41. | භාණ්ඩ පැටවීමේ හා බෑමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 42. | සුවඳ විලවුන් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම |
| 43. | බැංකුවක් පවත්වාගෙන යාම |
| 44. | බිම් ගඩොල් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම |
| 45. | සංඛ්‍යාංක මුද්‍රණය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 46. | ඇලුමිනියම් කණ්ණාඩි ගෘහ භාණ්ඩ ව්‍යාපාර භාණ්ඩ ලබාගැනීම හා අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම |
| 47. | පරිගණක මගින් අන්තර්ජාල පහසුකම සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 48. | නියෝජිත තැපැල් කාර්යාලයක් පවත්වාගෙන යාම |
| 49. | සිල්ලර බඩු පැකට් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 50. | ශාරීරික අභ්‍යාස කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (උපකරණ සහිතව) |
| 51. | මුදල් අයකරන පෞද්ගලික පෙර පාසලක් පවත්වාගෙන යාම |
| 52. | මුදල් අයකරන පෞද්ගලික පාසලක් පවත්වාගෙන යාම |
| 53. | රක්ෂණ මූල්‍ය ආයතන |
| 54. | විදේශීය මුදල් මාරු කර දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 55. | මුද්‍ර ගත් භාණ්ඩ අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම |
| 56. | වායු සමීකෘත පාන වර්ග අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම |
| 57. | ට්‍රැක්ටර් අලුත්වැඩියා කිරීම පවත්වාගෙන යාම |
| 58. | ආයුර්වේද බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම |
| 59. | මුහුදු බෙල්ලෝ කල් තබා ගැනීම |
| 60. | මුද්‍රණාලයක් පවත්වාගෙන යාම |
| 61. | මෝටර් වාහන අලුත්වැඩියා කිරීම |
| 62. | ඩීසල් පොම්ප අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 63. | වතුර පොම්ප අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම |
| 64. | මෝටර් රථ බර වාහන වෙළඳාම පවත්වාගෙන යාම |
| 65. | පුද්ගලික වෛද්‍ය ආයතනයක් (බෙහෙත් ශාලාවක් සහිතව) පවත්වාගෙන යාම |
| 66. | සිල්ලර බඩු වෙළඳාම පවත්වාගෙන යාම |
| 67. | මෝටර් වාහන බැටරිය අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 68. | මෝටර් යන්ත්‍රවලට විදුලි කම්බි නැවත සවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 69. | බැටරි චාජ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 70. | රබර් ටයර් ටියුබ් ගබඩා කිරීමේ හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 71. | පාපැදි අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 72. | විදුලි උපකරණ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 73. | විදුලි උපකරණ අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම |
| 74. | ගෑස් සිලින්ඩර් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම |
| 75. | දත් බැඳීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 76. | දන්ත වෛද්‍ය සායනයක් පවත්වාගෙන යාම |
| 77. | පළතුරු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 78. | පොල් අතු ගබඩා කිරීමේ හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |

79. දර ගබඩාවක් පවත්වාගෙන යාම
80. දූව ගබඩාවක් පවත්වාගෙන යාම
81. ශීතකරණ සහිත සිල්ලර භාණ්ඩ කඩයක් පවත්වාගෙන යාම
82. ගෘහ භාණ්ඩ අලෙවි කිරීමේ හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
83. කුෂන් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
84. රබර් මුද්‍රාවන් නිර්මාණය කරන ස්ථානයක් පවත්වාගෙන යාම
85. සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන, නිෂ්පාදනය කිරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
86. ත්‍රීරෝද රථ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
87. උළු අලෙවි කිරීමේ හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
88. සෙවිලි තහඩු අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
89. හිස් ගෝනි අලෙවි කිරීම හෝ තබා ගැනීම
90. මනාලියන් හැඩ ගැන්වීමේ විවාහ මංගල්‍ය සඳහා භාණ්ඩ සැපයීමේ, මල් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
91. හුණුගල් අලෙවි කිරීමේ හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
92. ඉරු ලී වෙළඳ සැලක් පවත්වාගෙන යාම
93. කළුගල් අලෙවි කිරීමේ හෝ රැස්කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
94. සිමෙන්ති ගබඩා කොට තැබීම හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
95. යකඩ භාණ්ඩ කඩයක් පවත්වාගෙන යාම
96. මිරිස් කුඩු අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
97. බේකරි නිෂ්පාදන අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
98. ඉන්ධන පිරවුම් හලක් පවත්වාගෙනයාම
99. කෘත්‍රිම මල්, නූල් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
100. ගුවන් ප්‍රවේශපත්‍ර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
101. ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම
102. ප්‍රචාරක දැන්වීම් ඇඳීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
103. පුවත්පත් අලෙවි කිරීමේ හා පුවත්පත් නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
104. පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
105. පෞද්ගලික විදුලි ගාස්තු රැස්කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
106. පිත්තල භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
107. පින්තූර රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
108. බිත්තර විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම
109. බර වාහන කුළියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
110. වේවැල් භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
111. විශේෂඥ වෛද්‍ය සේවාව ලබාදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
112. වීදුරු අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
113. වාහනවල ධාවනය පරීක්ෂා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
114. ජලනළ හා ජල උපාංග විකිණීම
115. පශු වෛද්‍ය සේවාව ලබා දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (පෞද්ගලික)
116. විසිතුරු මසුන් හා කුරුල්ලන් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
117. ශබ්ද විකාශන යන්ත්‍ර කුළියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
118. උකස් බඩු ගැනීම සහ මුදල් ණයට දෙන මධ්‍යස්ථානය පවත්වාගෙන යාම
119. නාමපුවරු දැන්වීම් පුවරු යනාදිය සාදා දීමේ නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
120. බුරුසු වර්ග ගබඩා කොට තැබීම හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
121. එම්බ්‍රොයිඩර් භාණ්ඩ ගබඩා කොට තැබීම හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
122. සම් භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
123. එළවළු වෙළඳසැලක් පවත්වාගෙන යාම
124. කරවල වෙළඳසැලක් පවත්වාගෙන යාම
125. ආසන වෙන් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
126. දුරකථන කාඩ් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
127. රියදුරු පුහුණු ආයතනයක් පවත්වාගෙන යාම
128. මහන මැෂින් අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
129. සත්ත්ව ආහාර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
130. වෛද්‍ය රසායනාගාරයක් පවත්වාගෙන යාම
131. රස කැවිලි විකිණීමේ ආයතනයක් පවත්වාගෙන යාම
132. තොග බඩු ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
133. ප්‍රදර්ශනාගාරයක් පවත්වාගෙන යාම
134. කොන්ත්‍රාත්කරුවන්
135. සිහිවටන සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
136. වාහන කුලියට දීමේ සේවාවක් පවත්වාගෙන යාම

| *ආදයම් බදු වලට අදල වර්ෂයේ පෙර වර්ෂයේ ගෙවිය යුතු මුදල අදල ව්‍යාපාරයේ ලබාගත් ආදායම් ලැබීම් වටිනාකම* | *ගෙවිය යුතු බද්ද රු. ශත* |
|---|---|
| 1. රුපියල් 6,000 ට අඩු | නැත |
| 2. රුපියල් 6,000ට වැඩි නමුත් රුපියල් 12,000ට අඩු | 90 0 |
| 3. රුපියල් 12,000ට වැඩි නමුත් රුපියල් 18,750ට අඩු | 180 0 |
| 4. රුපියල් 18,750ට වැඩි නමුත් රුපියල් 75,000ට අඩු | 360 0 |
| 5. රුපියල් 75,000ට වැඩි නමුත් රුපියල් 1,50,000 ට අඩු | 1,200 0 |
| 6. රුපියල් 1,50,000ට වැඩි | 3,000 0 |

07-1270/2

---

## කාත්තන්කුඩි නගර සභාව

### අවසර පත්‍ර ගාස්තු හා බද්දක් පැනවීම - 2015

2014.12.22 වන දින හා අංක 2014/122 දරන තීරණය අනුව 2013.01.01 දින සිට පහත සඳහන් ගාස්තු අයකරනු ලබන බව මෙයින් දැනුම් දෙමි. නගර සභා ආඥා පනතේ 162 වැනි වගන්තිය අනුව නගර සභාව සඳහා බද්දක් හා ගාස්තු පැනවීම සඳහා පවරා ඇති බලතල යටතේ එම ආඥා පනතේ 164(1) වගන්තිය මගින් සභාව විසින් නිකුත් කර ඇති බලපත්‍ර සඳහා බලපත්‍ර ගාස්තුවක් හා 165(අ) වගන්තිය අනුව නගර සභා බල ප්‍රදේශය තුළ පවත්වනු ලබන කර්මාන්තය සඳහා කර්මාන්ත බද්දක් ද 165(ආ) වගන්තිය අනුව නගර සභා බල ප්‍රදේශය තුළ පවත්වනු ලබන වෙළඳ ව්‍යාපාරික ස්ථාන සඳහා වෙළඳ ව්‍යාපාරික බද්දක් ද 2015 වර්ෂය සඳහා පනවා අයකිරීමට මෙම සභාව විසින් තීරණය කර ඇත. ඒ අනුව 2015.01.31 දිනට ප්‍රථම අවසර පත්‍ර ලබා ගත යුතු කර්මාන්ත හා ව්‍යාපාර සඳහා අදල ගාස්තුව ගෙවා අවසර පත්‍රය ලබාගත යුතු බවත් අනෙකුත් කර්මාන්ත හා ව්‍යාපාර සඳහා 2015.01.31 දිනට ප්‍රථම අදළ බද්ද ගෙවිය යුතු බවත් මෙයින් දැනුම් දෙමි. අදල කාල සීමාව තුල අදල බලපත්‍ර ලබා ගැනීමට හා බදු ගෙවීම පැහැර හරින විට ඒවාට එරෙහිව අංක 10609 දරන 1953 වසරේ නොවැම්බර් මස 06 වැනි දින ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ පළාත් පාලන ආයතන කාර්යාලය විසින් අනුමත කරන ලද විධිවිධාන අනුව නගරසභා ආඥා පනතේ 165(අ)(4) හා 165(ආ) වෙනි වගන්තිය අනුව මහාධිකරණයට ඉදිරිපත් කරන බව මෙයින් දැනුම් දෙමි. තව ද ලැයිස්තුවේ (1),(2),(3) අනුව නගර සභාවට ගෙවිය යුතු බලපත්‍ර ගාස්තු හා බදු ගෙවන ලෙස මෙයින් දන්වමි.

ජේ. සර්වේස්වරන්,
ලේකම්.

2015 ජූලි මස 07 වැනි දින,
නගර සභාව, කාත්තන්කුඩි.

07-1270/3

## කාත්තන්කුඩි නගර සභාව

### කර්මාන්ත බද්දක් පැනවීම

නගර සභා ආඥා පනතේ 165(අ) වැනි වගන්ති ප්‍රකාර කාත්තාන්කුඩි නගර සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2015 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවට මෙයින් නිවේදනය කරමි.

| *අංකය* | *වෙළඳ ව්‍යාපාරය හෝ කර්මාන්තය පිළිබඳ විස්තර* | *රු.750 කට වැඩි නොවන විට* | *රු.750ට වැඩි නමුත් 1500 ට වැඩි නොවන විට* | *රු.1500ට වැඩිවන විට* |
|---|---|---|---|---|
| | | *රු.* | *රු.* | *රු.* |
| 01. | කම්හලක් පවත්වාගෙනයාම | 500 | 750 | 1,000 |
| 02. | වඩුමඩුවක් පවත්වාගෙන යාම | 500 | 750 | 1,000 |
| 03. | බ්ලොක් ගල්, මල් බඳුන් සෑදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 | 750 | 1,000 |
| 04. | යකඩ, ලී ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙනයාම | 500 | 750 | 1,000 |
| 05. | හාල් මෝලක් පවත්වාගෙන යාම | 500 | 750 | 1,000 |
| 06. | පරණ ප්ලාස්ටික් භාණ්ඩ ප්‍රතිචක්‍රීකරණය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 | 750 | 1,000 |
| 07. | රසකැවිලි වර්ග නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 | 750 | 1,000 |
| 08. | විදුලි බලයෙන් ක්‍රියාකරන පේෂ කර්මාන්තයක් පවත්වාගෙනයාම | 500 | 750 | 1,000 |
| 09. | යකඩ ලියවන පට්ටලයක් (ලේත්) පමණක් පවත්වාගෙන යාම | 500 | 750 | 1,000 |
| 10. | මෝටර් රථ සර්විස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 | 750 | 1,000 |
| 11. | විදුලි බල හෝ වායු යොද පැස්සුම් වැඩ පමණක් සිදු කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 | 750 | 1,000 |
| 12. | ස්ප්‍රේ පෙයින්ට් කිරීම පමණක් | 500 | 750 | 1,000 |
| 13. | විදුලි බලයෙන් ක්‍රියා කරන යන්ත්‍රානුසාරයෙන් ලී ඉරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 | 750 | 1,000 |
| 14. | මිරිස්, තුනපහ ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 | 750 | 1,000 |
| 15. | යකඩ කර්මාන්තයක් පවත්වාගෙන යාම | 500 | 750 | 1,000 |

ජේ. සර්වේස්වරන්,
ලේකම්,
නගර සභාව, කාත්තන්කුඩි.

2015 ජූලි මස 07 වැනි දින,

07-1270/4

---

## යටිනුවර ප්‍රාදේශීය සභාව

### 2015.08.01 දින සිට මාර්ග පළුදු කිරීමේ ගාස්තු අයකිරීම

යටිනුවර ප්‍රාදේශීය සභාව විසින් 2015 වර්ෂයේ මැයි මස 15 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ තීරණ අංක 08:23 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. එම්. ටී. කේ. වලගෙදර,
සභාපති,
යටිනුවර ප්‍රාදේශීය සභාව.

2015 ජූලි මස 10 වැනි දින,
යටිනුවර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1893 දරන ගැසට් පත්‍රයේ 2014.12.12 දින ivආ කොටසේ ජල නළ එළීම සඳහා මාර්ග පළුදු කිරීමේ ගාස්තු පහත පරිදි සංශෝධනය වීම සුදුසු බවට යෝජනා කරමි.

(i) ජලනළ එළීමට මාර්ග පළුදු කිරීමේ දී රු. 750 00 ක ස්ථාවර ගාස්තුවක් අයකිරීම.
(ii) පස් සහිත මාර්ගයක් පළුදු කිරීම සඳහා වර්ග අඩි 01 කට රු. 95 00 බැගින් තැන්පතු මුදලක් අයකිරීම.
(iii) තාර හෝ කොන්ක්‍රීට් පාර පළුදු කිරීම සඳහා වර්ග අඩි 01කට රු. 150 00 බැගින් තැන්පතු මුදලක් අයකිරීම.
(iv) පාර නැවත යථා තත්ත්වයට පත් කිරීමෙන් අනතුරුව කාර්මික නිලධාරීගේ වාර්තාවක් ලබාගෙන ඉහත තැන්පතු මුදල මුදාහරිනු ලැබේ.

07-1326/2

---

**යටිනුවර ප්‍රාදේශීය සභාව**

2015.08.01 දින සිට ජල ගාස්තු අයකිරීම

යටිනුවර ප්‍රාදේශීය සභාව විසින් 2015 වර්ෂයේ මැයි මස 15 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ තීරණ අංක 08:22 යටතේ පහත දක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. එම්. ටී. කේ. වලගෙදර,
සභාපති,
යටිනුවර ප්‍රාදේශීය සභාව.

2015 ජූලි මස 10 වැනි දින,
යටිනුවර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1952 අංක 06 දරන පළාත් පාලන (සම්මත අතුරු ව්‍යවස්ථාවේ) පනතේ 02 වැනි වගන්තිය යටතේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් සම්පාදිත 1988 අගෝස්තු මස 23 වැනි දින අංක 520/7 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාවල 34 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර යටිනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ආඩියාතැන්න ජල යෝජනා ක්‍රමය සඳහා ගාස්තු අයකළ යුතු බවට යෝජනා කරමි.

| | *ගෘහස්ථ* |
|---|---|
| | *රු. ශත* |
| ඒකක 01 සිට 05 දක්වා | 30 0 |
| ඒකක 06 සිට 10 දක්වා | 35 0 |
| ඒකක 11 සිට 25 දක්වා | 40 0 |
| ඒකක 26ට වැඩි | 50 0 |

මීට අමතරව මාසික සේවා ගාස්තුව රු. 100 00 කි.

07-1326/1

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.